# බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
# External Degrees and Extension Courses Unit
## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## University of Sri Jayewardenepura

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/ EEX - 14 | ෆැක්ස්<br>Fax | 011-2802753 |
| ඔබේ අංකය<br>Your Number | | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| දුරකථනය<br>Telephone | 011-2801481, 011-3132496 | විද්‍යුත් තැපැල<br>E-mail | info.ext@sjp.ac.lk |


2022/09/29

ප්‍රිය ශිෂ්‍ය/ ශිෂ්‍යාව

**වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**

**ශිෂ්‍ය ලියාපදිංචිය දීර්ඝ කිරීම - 2018 ශිෂ්‍ය කණ්ඩායම**

2018 අධ්‍යයන වර්ෂය සඳහා වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ ඔබගේ එම ලියාපදිංචි කාල සීමාවට අදාළ සියළුම පරීක්ෂණ දැනට පවත්වා අවසන් කර ඇත. ඒ අනුව 2018/10/01 සිට 2021/09/30 දක්වා වූ එම ලියාපදිංචි කාල සීමාව තුල ඔබට උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබේ නම් හා තව දුරටත් පුනර් අපේක්ෂකයෙකු ලෙස අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන්නේ නම් එම ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය.

එසේම පරීක්ෂණ සඳහා අයදුම් කිරීමට පෙර ලියාපදිංචිය දීර්ඝ කර තිබීම අනිවාර්ය වේ. ඒ සඳහා නියමිත අයදුම්පත සහ මුදල් ගෙවිය යුතු ගිණුම් අංකය **external.sjp.ac.lk (Registration Renewal)** යන අපගේ වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය යෙදීමෙන් බාගත (Download) කරගත හැක. ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා එක් එක් අයදුම්කරුවන් වෙනුවෙන් වෙන වෙනම ගිණුම් අංක ලබා දී ඇති බැවින් ඔබට අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කල යුතුය. ඒ අනුව ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා ලබාගන්නා අයදුම්පත සම්පූර්ණ කර එම අයදුම්පත සමඟ නියමිත ගාස්තු ගෙවීමෙන් අනතුරුව ලබා ගන්නා රිසිට්පත සහ ශිෂ්‍ය වාර්තා පොත නියෝජ්‍ය ලේඛකාධිකාරි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2022/10/28 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ "**ලියාපදිංචිය දීර්ඝ කිරීම - 2018 වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**" යනුවෙන් සඳහන් සඳහන් කළ යුතුය.

**ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තු - එක් වසරක් සඳහා රු.7000.00**

පවත්නා නිර්ණායක අනුව පහත පරිදි ඔබගේ ලියාපදිංචිය දීර්ඝ කල හැක.

| ලියාපදිංචිය | ලියාපදිංචි කාලය | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - I | 2021/10/01 – 2022/09/30 | රු. 7000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - II | 2022/10/01 – 2023/09/30 | රු. 7000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - III | 2023/10/01 – 2024/09/30 | රු. 7000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - IV | 2024/10/01 – 2025/09/30 | රු. 7000.00 |

<u>සැලකිය යුතුයි</u>

- ඉදිරියට පවත්වන පුනර් පරීක්ෂණ සඳහා අයදුම් කරන්නේ නම් ඒ සඳහා අයදුම් කිරීමට ප්‍රථම එක් එක් පරීක්ෂණයට අදාලව පළ කෙරෙන විස්තර පත්‍රිකාවේ එම පරීක්ෂණය සඳහා ඔබගේ කණ්ඩායමට අදාලව තිබිය යුතු ලියාපදිංචි වලංගු දිනය දැක්වෙන අතර වෙබ් අඩවියෙන් අයදුම්පත බාගත කරගෙන එම දිනට ලියාපදිංචිය දීර්ඝ කර ගත යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය